# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2019

## CMS 2111 - සන්නිවේදන සිද්ධාන්ත

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න — කාලය පැය දෙකයි

---

1. සන්නිවේදන සිද්ධාන්තවල අපේක්ෂිත පරමාර්ථ හඳුන්වා දී සන්නිවේදන හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂී තත්ත්ව හා නව ප්‍රවණතා ග්‍රහණය කරගැනීමෙහි ලා සිද්ධාන්ත වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

   *(ලකුණු 20 යි)*

2. 'ජනමාධ්‍ය මගින් ප්‍රදානය කෙරෙන සන්දේශ සඳහා ග්‍රාහකයෝ ස්වීයත්ව ලක්ෂණ මත පදනම් ව විවිධාකාරයෙන් ප්‍රතිචාර දක්වති'. පුද්ගල විභින්නතා සිද්ධාන්තය (Individual Differences Theory) ඇසුරින් විවරණය කරන්න.

   *(ලකුණු 20 යි)*

3. ප්‍රචාරණය (Propaganda) පිළිබඳ සංකල්පය හඳුන්වා දී ප්‍රචාරණයේ අභිමතාර්ථ සාධනය සඳහා ප්‍රචාරණ ක්‍රමෝපාය උපයෝගී කොට ගැනෙන ආකාරය නිදර්ශන සහිත ව විග්‍රහ කරන්න.

   *(ලකුණු 20 යි)*

4. (අ) ප්‍රතිමානක සිද්ධාන්ත (Normative Theories) පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් සපයන්න.

   *(ලකුණු 10 යි)*

   (ආ) 'සමාජයක සන්නිවේදනය හා ජනමාධ්‍ය ක්‍රියාත්මක වන්නේ පවතින සන්දර්භයට සාපේක්ෂ ව ය.' ප්‍රතිමානක සිද්ධාන්ත ඇසුරෙන් විමසන්න.

   *(ලකුණු 10 යි)*

*(අනෙක් පිටුවට)*

5. පහත සඳහන් සංකල්ප අතරින් <u>දෙකක්</u> තෝරාගෙන සංක්ෂිප්ත විවරණ සපයන්න.

(i) පුද්ගල බලපෑම (Personal Influence) හා සන්නිවේදනයේ දෙපියවර ගලනය

(ii) සංතුලනය (Balance) හා ප්‍රජානන විෂමත්වය (Cognitive Dissonance)

(iii) මාක්ස්වාදී මාධ්‍ය විචාරය (Marxist Media Criticism) හා ජනමාධ්‍යයේ දේශපාලන ආර්ථිකය

*(ලකුණු 20 යි)*

6. පහත සඳහන් මාතෘකා අතරින් <u>හතරක් (04)</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(අ) පරිතෝෂණය පිළිබඳ සිද්ධාන්තය (Gratification Theory)

(ආ) අදහස් වගා කිරීමේ සිද්ධාන්තය (Cultivation Theory)

(ඇ) සමාජ ඉගෙනුම් සිද්ධාන්තය (Social Learning Theory)

(ඈ) මහජන මතය හා සමාජ මාධ්‍ය (Public Opinion and Social Media)

(ඉ) හැරල්ඩ් ලැස්වෙල් (Harrold Lasswell)

(ඊ) ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය (Frankfurt School)

*(ලකුණු 20 යි)*